025

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපනඥයින් සඳහා වන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2008

**ESP 1262** -ගුරු අධ්‍යාපනය පිළිබඳ පර්යාලෝකනයක්

කාලය - පැය තුනයි.

---

දිනය - 2008.05.24 වේලාව - ප.ව. 01.30 - ප.ව.04.30 දක්වා

---

ප්‍රශ්න <u>තුනකට</u> <u>(03) පමණක්</u> පිළිතුරු සපයන්න.

01. (i) ශ්‍රී ලංකාවේ පවත්නා විවිධ වර්ගයේ ගුරු පුහුණු ආයතනවල සංවිධානාත්මක ව්‍යුහය විභාග කරන්න. (ලකුණු 15)

(ii) ඒවා අතුරින් එක් ගුරු පුහුණු ආයතන වර්ගයක් තෝරා ගෙන එම ආයතන වර්ගය ගුරු පුහුණුකරුවන් සඳහා

(අ) අධ්‍යයන දිශාභිමුඛකරණය
(ආ) ප්‍රායෝගික දිශාභිමුඛකරණය
(ඇ) තාක්ෂණික දිශාභිමුඛකරණය

සැපයීමේ භූමිකාව තක්සේරු කරන්න. (ලකුණු 18)

02. (i) 'ගුරු ස්ථාපනය' **(Teacher Deployment)** යන යෙදුමෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවේ ගුරු ස්ථාපනය කෙරෙහි බලපාන ප්‍රධාන ගැටළු සාකච්ඡා කරන්න. (ලකුණු 14)

(iii) ශ්‍රී ලංකාවේ කාර්යක්ෂම ගුරු ස්ථාපන ක්‍රමයක් සංවර්ධනය කිරීම සඳහා ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 14)

03. (i) ප්‍රාරම්භක ගුරු අධ්‍යාපනය අඛණ්ඩ ගුරු අධ්‍යාපනයෙන් වෙනස් වන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 08)

(ii) ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා අඛණ්ඩ ගුරු අධ්‍යාපනයේ අවශ්‍යතාව ශ්‍රී ලංකාව වෙත විශේෂ අවධානයක් යොමු කරමින් විභාග කරන්න. (ලකුණු 12)

(iii) ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ගුරු අධ්‍යාපන වැඩ සටහන් වල ප්‍රබලතා හා දුබලතා සාකච්ඡා කරන්න. (ලකුණු 13)

04. (i) 'වෘත්තිය' යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii) වෘත්තියක් සතු ගරුත්වය පවත්වා ගෙන යාමට උපකාර වන වැදගත් ගුණාංග පහක් (05) විස්තර කරන්න. (ලකුණු 12)

(iii) ඔබ ඉහතින් දක්වා ඇති ගුණාංග ශ්‍රී ලංකාවේ ගුරු වෘත්තිය තුළ දක්නට ලැබේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 16)

05. (i) 'සවිබලකරණය' යන යෙදුමෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05)

(ii) ගුරුවරයකුගේ සවිබලකාරණය සඳහා අවශ්‍ය යයි ඔබ සිතන අංශ පහක් (05) පැහැදිලි කරන්න. (ලකුණු 13)

(iii) විපර්යකාරකයින් (change agents)ලෙස කටයුතු කිරීමට ගුරුවරුන් සවිබලකරණය උදෙසා ශ්‍රී ලංකාව තුළ ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 15)

06. පහත දැක්වෙන ප්‍රකාශන පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

(i) 'ගුරු වෘත්තියේ ගරුත්වය සහතික කිරීමට සහ ඔවුන්ගේ වෘත්තීය වගකීම් කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට ගුරුවරුන් ආචාර ධර්ම පද්ධතියකට බන්ධනය කළ යුතු වේ.'

(ii) 'රටේ සමාජ ආර්ථික තත්ත්වය තුළින් මතු වන අභියෝගයන්ට මුහුණ දීමට හැකිවන අයුරු ගුරුවරුන් පුහුණු කිරීමට ගුරු අධ්‍යාපන වැඩ සටහන් යොමු විය යුතුය.'

(iiii) 'වෘත්තීය සංවිධානයක සාමාජිකත්වය ලැබීම සෑම ගුරුවරයෙකුටම අත්‍යවශ්‍ය වේ.'

**(11 x 3 = 33 + 01 = 34)**

- හිමිකම් ඇවිරිණි. -